# ඉදප්පච්චතාව - පටිච්චසමුප්පාදය

## මහානිදන සූත්‍රය (දී.නි. 2, 80 පිට)

කල්පයක් තුළ ලොවට ලැබෙන අසිරිමත් නැවුම් ම දෙය නම් තථාගත දේශිත ශ්‍රී සද්ධර්මයයි. එය ශ්‍රවණය කොට තම ජීවිතයට සම්බන්ධ කරගත් පමණට මෙලොව ජීවිතයේ සාර්ථකත්වය මෙන් ම පරලොව සුගතිය ද සපුරා දුකින් නිදහස් ව සසර ගමන නවතාලීමට ද හැකියාව ලැබෙනු ඇත. එම සද්ධර්මයෙන් ප්‍රතිඵල නෙළා ගැනීම සඳහා කල්‍යාණමිත්‍ර ආශ්‍රය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරයි. කල්‍යාණ මිත්‍රත්වයෙන් නිසිඵල නෙළා ගත හැකි වන්නේ යමකු තුළ නුවණැතිබව, අවංකබව හා සුවචබව (මැනැවින් ඇහුන්කන්දීම) යන ගුණාංග තිබුණ පමණටයි (මහාවේඛනස්ස සුත්ත, ම.නි. 2, 400 පිට). කල්‍යාණ මිත්‍රත්වයෙන් අපට ලැබෙන මහගු දයාදය වන්නේ බුදුරදුන් වදළ සදහම් පණිවිඩයේ හරය ශ්‍රවණය කරන්නට ලැබීමෙන් දෙසවණට උතුම් ම ප්‍රතිලාභය හිමිවීමයි. මෙහිලා පටිච්චසමුප්පාදය ප්‍රධාන ඉගැන්වීම වශයෙන් සැලකිය හැකිය. අප ලෝකය සමඟ සම්බන්ධය පවත්වන ඇස, කණ ආදි ආයතන, රූප, වේදනාදි ස්කන්ධ, චක්ඛු ධාතු - රූප ධාතු - චක්ඛුවිඤ්ඤාණ ධාතු ආදි ධාතු 18, නාමරූප - විඤ්ඤාණ මේ ආදි සියලු ධර්මතා පිළිබඳ යථා ස්වභාවය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, විපරිණාම අදිය තේරුම් ගැනීමට අවස්ථාව ලැබෙන්නේ පටිච්චසමුප්පාදය පිළිබඳ අවබෝධය ලද පමණටයි. ඉහත සඳහන් ආයතන ආදි සියලු ධර්මතාවන්හි පවත්නා යථාර්ථය වන්නේ ඒවා පෙර නොතිබී හේතු ඇති කල්හි හටගෙන හේතු නිරුද්ධ වීමෙන් ඉතිරි නැතිව නිරුද්ධවීමයි (*අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති*). **පටිච්චසමුප්පාදය තේරුම් ගත් පමණට චතුරාර්ය සත්‍යය තේරුම් ගැනීමට අවස්ථාව උදවේ. මෙකී යථාර්ථයන් පසක් කළ පමණට සතර සතිපට්ඨානය භාවිත කොට අවිද්‍යාවෙන් සිත සම්පූර්ණයෙන් ම මුදවා ගෙන දුකින් නිදහස් වීමට අවස්ථාව උදවේ.**

තථාගතයන් වහන්සේ නමක් ලොව පහළ වන්නේත් උන් වහන්සේ දේශනා කරන දහම ලොව බබලන්නේත් කරුණු තුනක් ලොව පවතින බැවිනි. එනම් ජරා, මරණ සහ ජාති ය (තයොධම්ම සුත්ත). මෙම අභියෝග තුන ජය ගත හැක්කේ පටිච්චසමුප්පාද සංඛ්‍යාත ආර්ය න්‍යාය තේරුම් ගෙන සති සම්පජඤ්ඤය වැඩීමේ ප්‍රතිඵල වශයෙනි.

බුදුදහමේ ඇතුළත් සුවිශේෂී ඉගැන්වීම අන්තර්ගත වන්නේ පටිච්ච සමුප්පාද විග්‍රහය තුළයි. 'පටිච්චසමුප්පාද', 'අරියඤය' (අනාථපිණ්ඩික සුත්ත, සං.නි. 2, 212 පිට), 'ඉදප්පච්චයතා' (මහානිදන සුත්ත, දී.නි.2, 80), 'උදයබ්බයගාමී පඤ්ඤ' (ව්‍යග්ඝපජ්ජ සුත්ත), 'සම්මාදිට්ඨි' (මහාචත්තාරීසක සුත්ත, ම.නි.), 'අනිච්චතා' ආදි විවිධ නම්වලින් මෙම න්‍යාය බුදුදහමෙහි විස්තර කොට තිබේ. භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන්ට *'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං...'* යනුවෙන් දේශනා කළේ ද, බාහිය දරුචීරියට *'දිට්ඨෙ දිට්ඨමත්තං සුතෙ සුතමත්තං මුතෙ මුතමත්තං විඤ්ඤතෙ විඤ්ඤතමත්තං....'* යනුවෙන් පැහැදිලි කළේ ද, අනාථපිණ්ඩික සිටුතුමාට *'ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාද ඉදං උප්පජ්ජති....*(පංචභයවේර සුත්ත, සං.නි.2, 108)' යනුවෙන් දේශනා කළේ ද, අස්සජි මහරහතන් වහන්සේ වහන්සේ *'යෙ ධම්මා හේතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ....*(ම.ව.)' යනුවෙන් උපතිස්ස පරිබ්‍රාජකයාට දේශනා කළේ ද මෙම එක ම අනුශාසනයයි. මෙය තේරුම් ගත් පමණට දුකෙහි හටගැනීම හා නිරෝධය පිළිබඳ වූ චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධය දියුණු වේ. විශේෂයෙන් සත්ත්වයා නිර්මාණය වී ඇති ස්කන්ධ, ධාතු, ආයතන, නාමරූප පිළිබඳ දැනුම පිරිසිදු වේ. එපමණට දුකින් නිදහස්වීමේ ඒකායන මාවත වූ සතර සතිපට්ඨානයට අනුව ජීවත්වීමේ උනන්දුවක් හටගනී. සතර සතිපට්ඨානය තුළ වාසය කළ පමණට අපා දුකින් මෙන් ම සසර දුකින් ද නිදහස් වීමට අවස්ථාව ලැබේ. මෙලොව උපත ලැබූ අයෙකුට ලද හැකි උසස් ම රැකවරණය වන්නේ සතර සතිපට්ඨානයයි.

දීඝනිකායෙහි ඇතුළත් මහානිදන සූත්‍රයෙහි සත්ව ක්‍රියාකාරීත්වය පිළිබඳ එකිනෙක අංගයන්හි පවත්වා හේතුඵල සම්බන්ධතාව විස්තර කර තිබේ. භාග්‍යවතුන් වහන්සේ එක් කලෙක කුරුරට කම්මාසදම්ම නම් කුරුවැසියන්ගේ නියම්ගමෙහි වැඩ වෙසෙන සමයෙහි ආනන්ද මාහිමියන් සමඟ සිදු කළ සංවාදය මෙම සූත්‍රයට පාදක වී තිබේ. දිනක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ආනන්ද මාහිමියන් වහන්සේ **පටිච්චසමුප්පාදය ගැඹුරු ඉගැන්වීමක් බවත් එහෙත් එය අවබෝධ කර ගැනීම අපහසු නොවන බවත් සඳහන් කළහ.** මෙහි දී භාග්‍යවතුන් වහන්සේ අනඳ මාහිමියන්ට දේශනා කළේ **ආනන්ද එසේ නොපවසන ලෙසයි.** පටිච්චසමුප්පාදය ගැඹුරු බවත් ගැඹුරු පෙනුම් ඇති බවත් සඳහන් කළහ. මෙම පටිච්චසමුප්පාදය අවබෝධ නොකිරීමෙන් ප්‍රතිවේධ නොකිරීමෙන් මේ සත්ත්ව ප්‍රජාව නූල් කැටියක් මෙන් අවුල් වූයේ කැඳ ලූ නූල් පන්දුවක් මෙන් ගැටගැසුණ

මුදුනණ බබස් තණ මෙමන් අවුල් වූයේ සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විනිපාත (විෂම ලෙස වැටෙන) අපාය ද සසර නොඉක්මවයි (මහානිදන සුත්ත, දී.නි.2, 80). සත්ත්වයන් සසර බොහෝ කලක් අවිද්‍යා - තෘෂ්ණා දැලට හසු වී පැටලී මෙලෙස ගමන් කරන්නේ මෙම ආර්ය න්‍යාය අවබෝධ කර නොගැනීම නිසා බව අවධාරණය කළහ. මෙහි දී බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදය පිළිබඳ දීර්ඝවූත් සවිස්තරාත්මක වූත් දේශනාවක් ඉදිරිපත් කරති.

අප දනට අත්විඳින ජරාමරණාදි දුක් සමුදයේ පටන් අවිද්‍යාව දක්වා වූ ඊට පාදක වන හේතු මෙහිදී විස්තර කරති. 'ජරා' යනු ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් දිරීමක්, දිරෙන බවක්, දත්වැටීම්, කෙස් පැසීම්, ඇඟ රැලි වැටීම්, ආයු පිරිහීම්, ඉඳුරන්ගේ පැසීම් ආදියක් වේ ද එයයි. 'මරණ' ඒ ඒ සත්ත්වනිකායෙන් ඒ ඒ සත්ත්වයන්ගේ යම් චෙන්වීමක්, බිඳීමක්, අතුරුදහන් වීමක්, මච්චු නම් වූ මරණයක් කාලක්‍රියාවක් ස්කන්ධයන්ගේ බිඳියාමක්, සිරුර හැර දැමීමක්, ජීවිතින්ද්‍රියේ සිඳී යාමෙක් වේ ද මෙයයි. යම් ප්‍රත්‍යයකින් ජරාමරණ වේ නම් එසේ වූ ප්‍රත්‍යයක් ඇද්දැයි විචාරණ ලද්දහු විසින් 'ඇතැ'යි ඔහුට පිළිතුරු දිය යුතු ය. කුමක් ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ දැයි මේ විචාරන්නේ නම් ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යැයි ඔහුට කිව යුතු ය (ජාතිපච්චයා ජරාමරණන්ති ඉච්චස්ස වචනීයං). සත්ත්වයා ජරාමරණාදි දුක්වලට මුහුණ දෙන්නේ ඉපදීම හේතුවෙනි. එය හුදෙක් නව භවයක ඉපදීම පමණක් නොව හැම මොහොතකදී ම කර්මයනට අනුව නිර්මාණය කර ගන්නා උපතයි.

ජාතිය හෙවත් උපතට හේතුව වශයෙන් දක්වන්නේ භවයයි (*භවපච්චයා ජාතීති ඉච්චස්ස වචනීයං*). 'භව' යනු ලෝකයක් ඇති බවට සිතෙන ස්වභාවයයි. ඒ අනුව කාමභව, රූපභව, අරූපභව වශයෙන් ත්‍රිවිධාකාරයෙන් ලෝකයක් මුණ ගැසේ. මේ තුනේ ම සිටීම සංසාර චක්‍රය තුළ ම සැරිසැරීමකි. බුදුරදුන් ධර්මය දේශනා කළේ මේ ත්‍රිවිධ භවයෙන් ම නිදහස්වීමටයි.

භවයට හේතුව උපදනයයි (*උපාදනපච්චයා භවො'ති ඉච්චස්ස වචනීයං*). 'උපාදන' යනු තමා වෙත ඇද - බැඳ තබා ගන්නා ස්වභාවය. මෙය කාම උපාදන, දිට්ඨි උපාදන, සීලබ්බත උපාදන, අත්තවාද උපාදන වශයෙන් සිව් වැදෑරුම් වේ (විභ.ප.1, 246 පිට). 'උපාදන' යන්න 'අධිමොක්ඛ' (අරමුණෙහි නිශ්චිත බව නොහොත් බැසගත් බව) නමින් ද ඇතැම් තැනෙක ව්‍යවහාර කෙරේ (විභ.ප.1, 290 පිට).

උපාදනයන්ට හේතුව තණ්හාවයි (*තණ්හාපච්චයා උපාදනන්ති ඉච්චස්ස වචනීයං*). 'තණ්හා' යනු ඇස ආදි ඉන්ද්‍රියයන්ට ගෝචර වන රූපාදියට සිත ඇලීමයි, බැස ගැනීමයි. ඒ අනුව රූපතණ්හා, ශබ්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා වශයෙන් සයාකාර වේ (විභ.ප.1, 246 පිට).

තණ්හාවට හේතුව සැප, දුක් ආදි වේදනායි (*වේදනාපච්චයා තණ්හා'ති ඉච්චස්ස වචනීයං*). 'වේදනා' යනු සැප දුක් උපේක්ෂා වශයෙන් විඳ ගන්නා ස්වභාවය නම් වේ. මෙය කයක් (වේදනාකාය) වශයෙන් දක්වෙන අතර ඇස ආදි ස්පර්ශයන් විෂයයෙහි වේදනා හටගනී. ඒ අනුව වේදනාව ද සයාකාර වේ. එනම් චක්ඛුසම්ඵස්සජා වේදනා, සෝතසම්ඵස්සජා වේදනා, ඝාණසම්ඵස්සජා වේදනා, ජිව්හාසම්ඵස්සජා වේදනා, කායසම්ඵස්සජා වේදනා, මනෝසම්ඵස්සජා වේදනා වශයෙනි (විභ.ප.1, 246 පිට). තවත් පර්යායකට අනුව පටිඝ හෙවත් ද්වේශය හටගන්නේ වේදනාව නිසායි (වේදනා පච්චයා පටිඝං, විභ.ප.1, 292 පිට).

වේදනාවට හේතුව ඵස්සයයි (*ඵස්සපච්චයා වේදනා'ති ඉච්චස්ස වචනීයං*). 'ඵස්ස' = ස්පර්ශ යනු - ඇස ආදි ඉන්ද්‍රියයන්ට රූපාදි අරමුණු ආපාතගත වීම. මෙය එක්තරා කයක් (වේදනාකාය) වශයෙන් සඳහන් වන අතර ඇස ආදි ඉන්ද්‍රිය ඔස්සේ රූපාදි අරමුණු විෂයයෙහි ස්පර්ශය හටගනී. ඒ අනුව ස්පර්ශය ද සයාකාර වේ. එනම් චක්ඛුසම්ඵස්සය, සෝතසම්ඵස්සය, ඝාණසම්ඵස්ස, ජිව්හාසම්ඵස්සය, කායසම්ඵස්සය, මනෝසම්ඵස්සය වශයෙනි. ඵස්සයට හේතුව සළායතන වන අතර සළායතන නිරුද්ධ කිරීමෙන් ඵස්සය ද නිරුද්ධ වේ.

ඵස්සයට හේතුව වශයෙන් මහානිදන සූත්‍රයෙහි දක්වෙන්නේ නාමරූප වශයෙනි (*නාමරූපපච්චයා ඵස්සො'ති ඉච්චස්ස වචනීයං*). මෙය සාමාන්‍ය පටිච්චසමුප්පාද විග්‍රහයට වඩා මදක් වෙනස් අර්ථකථනයකි. සාමාන්‍යයෙන් ස්පර්ශයට හේතුව සළායතන වශයෙනුයි දක්වෙන්නේ. එහෙත් මෙහිදී සළායතන යන්න නොකියා නාමරූප ප්‍රත්‍යයෙන් ස්පර්ශය හටගන්නා බව දක්වා තිබේ. මෙහි දී අප තේරුම් ගත යුත්තේ පටිච්චසමුප්පාදය පිළිබඳ බුදුරදුන් විසින් දේශිත විවිධ පර්යායයන්හි ස්වභාවයයි. නාමරූප යන විග්‍රහ තුළ ම සළායතනය යන්නත් මෙහි අන්තර්ගත ව තිබේ. නාමරූප යන්නෙහි '**නාම**' යනු වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර යන පහයි. නැතහොත් වේදනා, සඤ්ඤා, සංඛාර යන ස්කන්ධ තුනයි (විභ.ප., 1, 276 පිට). තවත් පර්යායකට අනුව වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ හතරට ම 'නාම' යන්න ව්‍යවහාර කර තිබේ

(විභ.ප.1, 282 පිට). '**රූප**' යනු පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහාභූත සහ චක්ඛු, සෝතාදි උපාදාය රූප විසිහතරයි (විභ.ප.1, 244 පිට). මෙහිලා විශේෂයෙන් රූප නමින් දක්වන්නේ මනෝපරියාපන්න රූපයි. එනම් චක්ඛායතන, සෝතායනන, ඝානායතන, ජිව්හායතන හා කායායතන යන ආයතනයන්ගේ ඉපදීමයි. ඊට අමතර වූ යම්තාක් චිත්තජ, චිත්තහේතුක, චිත්තසමුට්ඨාන රූප වේද ඒ සියල්ල ද රූප යන්නට අයත් වේ. (විභ.ප., 1, 276 පිට).

නාමරූපයනට හේතුව විඤ්ඤාණයයි (*විඤ්ඤාණපච්චයා නාමරූපන්ති ඉච්චස්ස වචනීයං*). විඤ්ඤාණ - යමක් දැන ගන්නා ස්වභාවය 'විඤ්ඤාණ' = විඥාන නම් වේ. ඇස ආදි ඉන්ද්‍රිය ඔස්සේ මෙම දැන ගැනීම සිදු කෙරෙන බැවින් මෙය එම ආයතනයන්ගේ නමින් දක්වා හයාකාර වශයෙන් විස්තර කර තිබේ. එනම් චක්ඛුවිඤ්ඤාණ, සෝතවිඤ්ඤාණ, ඝාණවිඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කායවිඤ්ඤාණ, මනෝවිඤ්ඤාණ වශයෙනි (විභ.ප.1, 244 පිට).

විඤ්ඤාණයට හේතුව වශයෙන් නැවත දක්වා ඇත්තේ නාමරූපයි (*නාමරූපපච්චයා විඤ්ඤාණන්ති ඉච්චස්ස වචනීයං*). එනම් නාමරූප - විඤ්ඤාණ යන විග්‍රහය අඤ්ඤමඤ්ඤ (අන්‍යමන්‍ය) වශයෙන් මෙහි දක්වා තිබේ. නළකලාප සූත්‍රය වැනි දේශනාවන්හි දැක්වෙන පරිදි නාමරූප හා විඤ්ඤාණ ඔවුනොවුන්ට උපකාරවත් බව ලබමින් ක්‍රියාත්මක වන ආකාරය මෙමඟින් විග්‍රහ වේ. පටිච්චසමුප්පාද අංග දක්වන වෙනත් දේශනා අතර මෙහි පවත්නා වෙනස නම් මෙහි විඤ්ඤාණයට හේතුවන ඊට මුලින් ඇති සංඛාර, අවිද්‍යා යන අංග දෙක නොදක්වා විඤ්ඤාණයේ පටන් ලෝකය නිර්මාණය වන ආකාරය විස්තර කර තිබීමයි.

ඒ අනුව විඤ්ඤාණයේ පටන් ජරාමරණ දක්වා ප්‍රත්‍ය අනුව දුක හටගන්නා ආකාරය මහානිදාන සූත්‍රයෙහි දක්වා තිබේ. මෙතැන් පටන් ජාති ආදි කරුණු නැවත විස්තර කරනු දක්නට ලැබේ. ඒ අනුව යමෙකුට දේව, ගන්ධබ්බ, යක්ඛ, භූත, මනුස්ස, සිව්පා, පක්ෂී, සිරිංසප ආදි ජාතියක් නොවේ නම් ජරාමරණ නොපැනෙන බව විස්තර වේ. මෙහිලා පැහැදිලි වන කරුණක් නම් ජාති යනු හුදෙක් නැවත භවයක උපත ලැබීම ම නොව භවය හේතුවෙන් මේ මොහොතෙහි අප නිර්මාණය කර ගන්නා ජාතියයි. එනම් අපේ මානසිකත්වය මත කාමභව, රූපභව, අරූපභව වශයෙන් අප ජීවත් වන මානසිකත්වයයි. භවය හෙවත් උපතක් පිණිස හේතුවන අප අවට ලෝකය අවිද්‍යාවෙන් නිර්මාණය කර නොගත හොත් ජාතියක් නිර්මාණය නොවේ.

භවයට හේතුවන්නේ උපාදානයි. එනම් කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද වශයෙන් යමක දැඩිව පිහිටා සිටීමයි. උපාදාන නොමැති නම් භවයක් නිර්මාණය නොවේ. උපාදානයට හේතුව තණ්හාවයි. රූපතණ්හා ආදි තෘෂ්ණා නැති කල්හි උපාදාන හට නොගනී. තණ්හාවට හේතුව වේදනාවයි. එනම් ස්පර්ශය නිසා වේදනාව හටගන්නා බව පිළිබඳ අනවබෝධයෙන් (අවිද්‍යා සහගතව) වේදනා ඇසුරු කිරීමයි. මෙහිදී සමුදාචාර තණ්හාව හෙවත් මේ ජීවිතයේ තණ්හාව නිසා හටගන්නා ක්‍රියාකාරීත්වය පිළිබඳ සවිස්තර පැහැදිලි කිරීමක් දැක ගත හැකිය. ඒ අනුව **වේදනාව නිසා තණ්හාව හටගෙන තණ්හාව නිසා අරමුණු සෙවීම (පරියේසනං), පරියේසනය නිසා ලාභය, ලාභය නිසා විනිශ්චය, විනිශ්චය නිසා ඡන්දරාගය, ඡන්දරාගය නිසා අජ්ඣෝසානය (මම ය, මාගේ ය වශයෙන් බලවත් ව සනිටුවහන් කිරීම), අජ්ඣෝසායනය නිසා පරිග්‍රහය (අත්කර ගැනීම), පරිග්‍රහය නිසා මසුරුබව, මසුරුබව නිසා ආරක්ෂාකිරීම, ආරක්ෂාධිකරණය නිසා දණ්ඩාදාන, සත්ථාදාන, කලහ, විග්‍රහ, විවාද, ඇනුම් බැණුම්, කේලාම්, මුසාබස් ආදි නොයෙක් ලාමක අකුසල ධර්ම පහළ වේ.** ඉන්පසු නැවත අවරෝහණ ක්‍රමයට අග පටන් තෘෂ්ණාව දක්වා මේ කරුණුවල එකිනෙක සම්බන්ධය පැහැදිලි කර ඇත. මෙහිලා එක් අතකින් පටිච්චසමුප්පාදයේ අංගයක් ලෙස වට්ටමූලික (සාංසාරික පැවැත්ම පදනම් කරගත්) තෘෂ්ණාවක් නොහොත් වේදනාවක් දක්වන අතර අනෙක් අතට සමුදාචාර වශයෙන් තෘෂ්ණා පාදකව මේ ජීවිතයේ ඇතිවන ගැටලු ද විග්‍රහයට ලක් කර තිබේ.

මෙහි දී තෘෂ්ණාවට වේදනාව ප්‍රත්‍යය වශයෙනුත් වේදනාවට ස්පර්ශය ප්‍රත්‍යය වශයෙනුත් ස්පර්ශයට ප්‍රත්‍යය නාමරූප වශයෙනුත් දක්වා නාමරූප හා ස්පර්ශය අතර වැඩිදුර විග්‍රහයක් කෙරේ.

## පටිඝ සම්ඵස්සය හා අධිවචන සම්ඵස්සය

මහානිදාන සූත්‍රයෙහි පටිච්චසමුප්පාදය විස්තර කිරීමේ දී විශේෂ කරුණක් සාකච්ඡාවට භාජනය කොට තිබේ. එනම් පටිඝසම්ඵස්සය හා අධිවචන සම්ඵස්සයයි. '**පටිඝ සම්ඵස්සය**' යනු ඇස, කන, නාසය, දිව, කය යන ආයතන පහට රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන අරමුණු ස්පර්ශ වීමයි. මෙය රළු ස්පර්ශය වශයෙන් සඳහන් වේ. '**අධිවචන සම්ඵස්සය**' යනු මනින්ද්‍රියට ධර්මාලම්භන අරමුණු වීමයි. මෙය සුඛුම (සියුම්) ස්පර්ශය

වශයෙන් දක්වේ. සාමාන්‍යයෙන් යමෙකු ජීවත්වීම යනු ඇස, කන, නාසය, දිව, කය, මනස යන ඉන්ද්‍රිය හයට රූප, ශබ්ද, ගන්ධ, රස, ෆොට්ඨබ්බ, ධම්ම යන අරමුණු ස්පර්ශ වීම් වශයෙන් අද්දැකීම් ලැබීමයි. මෙම ආයතන හය හා ඊට ගෝචර වන බාහිර අරමුණු හැර ජීවිතයෙහි වෙනත් කිසිවක් නොමැත. පුද්ගලයාගේ සමස්ත ජීවිතය මෙම ආයතන මත රඳා පවතී.

මහානිදන සූත්‍රයේ 'නාමරූපපච්චයා ඵස්සෝ' යන විග්‍රහයෙහි දී දැක්වෙන විශේෂ කරුණක් වන්නේ පටිඝ සම්ඵස්සය අධිවචන සම්ඵස්සයටත් අධිවචන සම්ඵස්සය පටිඝ සම්ඵස්සයටත් බලපාන ආකාරයයි.

### රූපකායෙ අධිවචනසම්ඵස්සයඃ

*'යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තේහි යෙහි උද්දේසෙහි නාමකායස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසු අසති අපි නු ඛෝ රූපකායෙ අධිවචනසම්ඵස්සො පඤ්ඤායෙථාති? 'නො හෙතං භන්තෙ'*

'ආනන්ද, යම් ආකාරයන්ගෙන් යම් ලිඞ්ගයන්ගෙන් යම් නිමිතිවලින් යම් උද්දේසයන්ගෙන් නාමකයට ප්‍රඥප්ති වේද, ඒ ආකාර ලිඞ්ග නිමිති උද්දේස නැති කල්හි රූපකයෙහි අධිවචන සම්ඵස්සය පැනවීමක් වන්නේ ද? ස්වාමීනි, එසේ නොවන්නේ ය'.

මෙයින් ප්‍රකට කෙරෙන්නේ ආයතන කුසලතාව ඇති කර ගත යුතු ආකාරයයි. අවිද්‍යා සහගතව අපි ඇස, කන ආදි කිසියම් ආයතනයකින් රූප, ශබ්දදි අරමුණක් ගත් විට එය සෙසු ඉන්ද්‍රියයන්ට සම්බන්ධ කර බලන්නෙමු. නිදසුනක් ලෙස මලක් දුටු විට එය තමාගේ මනසේ අතීත අද්දැකීම් සමග මුසු කොට නව සංස්කාරයක් ගොඩනගා ගනී. අවිද්‍යා සහගත මනසේ ස්වභාවය මෙයයි. එවිට ඉන්ද්‍රිය මගින් ගන්නා අරමුණු විෂයයෙහි ඇලීම්, ගැටීම් හෝ උපේක්ෂා හටගනී. මේ කුමක් ස්පර්ශ කළ ද අපි දුකින් නොමිඳුණාහු වෙමු. ආයතන කුසලතාව යනු දුක හටගන්නා මෙම ආකාරය මැනැවින් නුවණින් දැක ඇස, කන ආදි ඉන්ද්‍රිය මගින් රූප, ශබ්ද ආදි අරමුණ ගන්නා විට එය වෙනත් ආයතනයකට ගැට නොගසා ඒ ආයතනය තුළදී ම නිරුද්ධ වන දර්ශනයකින් හා සිහියකින් යුතුව සිටීමයි. මෙහි දී විශේෂයෙන් රූපකායේ අධිවචන සම්ඵස්සය පැනවීම වශයෙන් දක්වා ඇත්තේ ඇස, කන, නාසය, දිව, කය යන ඉන්ද්‍රිය පහට පටිඝසම්ඵස්ස වශයෙන් අරමුණු ගෝචරවීමේ දී එය මනින්ද්‍රියට ගැටගැසීම් ස්වභාවයයි. යමෙක් මෙය නුවණින් දුටුව හොත් ඔහු ඇස, කන ආදි පංච ඉන්ද්‍රියයන්ගෙන් ගන්නා අරමුණු ඔස්සේ මනසට බැස ගැනීම නොකරයි. එවිට ඔහුගේ අවිද්‍යා සහගත ස්පර්ශය දුරුවූයේ වෙයි. දුක නිර්මාණය වන පටිච්චසමුප්පාද න්‍යායයෙන් නැතහොත් සංසාර චක්‍රයෙන් ඉවත් වූයේ වෙයි. එවිට ජරා, මරණාදි ස්වභාවයන් තමාගේ කර නොගනී. දුකින් නිදහස්වූයේ සිහිල් භාවයට පත් වූයේ වෙයි.

### නාමකායේ පටිඝසම්ඵස්සයඃ

*'යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තේහි යෙහි උද්දේසෙහි රූපකායස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසු අසති අපි නු ඛෝ නාමකායෙ පටිඝසම්ඵස්සො පඤ්ඤායෙථාති? 'නො හෙතං භන්තෙ'*

'ආනන්ද, යම් ආකාරයන්ගෙන් යම් ලිඞ්ගයන්ගෙන් යම් නිමිතිවලින් යම් උද්දේසයන්ගෙන් රූපකයට ප්‍රඥප්ති වේද, ඒ ආකාර ලිඞ්ග නිමිති උද්දේස රූප කයට නැති කල්හි නාමකයෙහි පටිඝසම්ඵස්සය පැනවීමක් වන්නේ ද? ' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න කළ විට ආනන්ද මාහිමියන් පිළිතුරු දෙන්නේ 'ස්වාමීනි, එසේ නොවන්නේ ය'. යනුවෙනි.

මෙයින් පැහැදිලි කෙරෙන්නේ රූපයන් පිළිබඳව ලිඞ්ග, නිමිති, උද්දේස ආදි වශයෙන් ප්‍රඥප්ති ඇති විට සිතට ධම්මාලම්බන අරමුණු වූ විට ඒ ඔස්සේ රූප, ශබ්දදි පංච විඤ්ඤාණයට ලක්වන අරමුණු විෂයයෙහි සිත බැස ගන්නා බවයි. එනම් අවිද්‍යා සහිගතව සිටින විට සිතට කිසියම් සිතිවිල්ලක් පැමිණීමේ දී එය බාහිර රූපයකට බැඳ ගන්නා බවයි. එවිට සිත බාහිර අරමුණුවල බැස ගනියි. නිදසුනක් වශයෙන් තම මව සිහි වූ විට මවගේ රූපය, ඇයගේ කටහඬ ආදිය පිළිබඳව සිත බැස ගැනීමයි. ලුණු සිහිවූ විට ලුණු කැටයක් මැවී පෙනෙන ස්වභාවයයි. මෙලෙස සිතට සිතිවිලි නැගෙන විට ඒ ඔස්සේ රූප නිර්මාණය කිරීම් වශයෙන් පටිඝසම්ඵස්සය

කරා යාම අවිද්‍යා සහගත මනසේ ස්වභාවයයි. එවිට දුකින් නොමිඳුණේ ජරා, මරණාදි දුක් ස්පර්ශ කරමින් සිටී. එසේ නොවීමට නම් සිතට සිතිවිල්ලක් පැමිණි සැණින් ම එය සිත තුළ ම නිරුද්ධ වන දර්ශනයකින් යුතුව සිටීම අවශ්‍ය කෙරේ. '*විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං....*' යනුවෙන් දක්වෙන්නේ මෙම ආයතන කුසලතාවයි. එවිට සිතට නැඟෙන අරමුණු බාහිර රූපයට බැඳ, බැස ගන්නා ස්වභාවයෙන් මිදෙයි. විද්‍යා සහගතව මෙලෙස සිහියෙන් හා නුවණින් ක්‍රියා කිරීමෙන් පටිච්චසමුප්පාද චක්‍රයෙන් මිදී දුකින් නිදහස්වීමට අවකාශ සැලසේ.

මේ සඳහා හැම මොහොතක ම පටිච්චසමුප්පාද චක්‍රය සකස්වන ආකාරය පිළිබඳ මනා අවබෝධයකින් හා සතිසම්පජඤ්ඤයෙන් ක්‍රියා කිරීම අවශ්‍ය කෙරේ. ක්‍රමයෙන් දුකින් නිදහස්වීමට අවකාශ ලැබෙන්නේ මෙහි අඛණ්ඩව යෙදීමේ ප්‍රතිඵල වශයෙනි. ඒ සඳහා අප සතු සියල්ල කැප කළ යුතුව ඇත. ලැබූ මේ උතුම් ක්ෂණ සම්පත්තිය අහිමිවීමට ප්‍රථම හැකිතාක් දුරට ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්ම දියුණු කළ යුතු ය.

## විඤ්ඤාණය මව්කුසට බැස ගැනීම

මහානිදන සූත්‍රයෙහි දක්වෙන පරිදි 'විඤ්ඤාණය මව්කුසෙහි බැස නොගන්නේ නම් නාමරූපයන්ගේ පහළවීමක් නොවේ' (...*විඤ්ඤාණං ච හි ආනන්ද මාතුකුච්ඡිස්මිං න ඔක්කමිස්සථ, අපි නු බෝ නාමරූපං මාතුකුච්ඡිස්මිං සමුච්චිස්සථාති'? 'නො හෙතං භන්තේ'*). විඤ්ඤාණය මව්කුසකට බැස ගත්ත ද එම විඤ්ඤාණය නැවත මව්කුසින් ඉවත් වන්නේ නම් නාමරූපයන්ගේ වැඩිදියුණුවක් ද සිදු නොවේ ('*විඤ්ඤාණං ච හි ආනන්ද මාතුකච්ඡිං ඔක්කමිත්වා වොක්කමිස්සථ, අපි නු බො නාමරූපං ඉත්ථත්තාය අභිනිබ්බත්තිස්සථාති' 'නො හෙතං භන්තේ*'). තවද විඤ්ඤාණය සිඳී ගියහොත් නාමරූපයන්ගේ වර්ධනයක් හෝ කිසියම් නමක් ඇති පුද්ගලයකුගේ නිර්මාණය සිදු නොවනු ඇත (මහානිදන සුත්ත, දී.නි.2, 92 පිට). සළායතන, ඵස්ස ආදි සෙසු අංගයන්හි ක්‍රියාකාරීත්වය සිදු වන්නේ නාමරූප විඤ්ඤාණ දෙකෙහි ස්ථාවර ක්‍රියාකාරීත්වය මතයි. මෙයින් පැහැදිලි වන්නේ නාමරූප මව්කුසෙහි බැස ගැනීමටත් එය වර්ධනය වීමටත් විඤ්ඤාණය ඍජු දයකත්වයක් දක්වන බවයි.

මෙලෙස මහානිදන සූත්‍රයෙහි විස්තර කෙරෙන විශේෂ විග්‍රහයක් නම් ප්‍රතිසන්ධි විඤ්ඤාණය මව්කුසට බැසගැනීම සම්බන්ධ පැහැදිලි කිරීමයි. ඒ අනුව මව ඍතුවට පත්ව සිටීනම් මව්පියන්ගේ සම්බන්ධතාව පවතී ද එවිට නිසිකාලය සපුරා ඇති විට විඤ්ඤාණයක් මව්කුසට බැස ගැනීමේ හැකියාව පවතී. විඤ්ඤාණයක් බැස ගැනීමට සුදුසු පරිසරය සකස් ව තිබුණ ද විඤ්ඤාණය මව්කුසට බැස නොගත්තේ නම් (කලලය මිශ්‍රව පවතින) නාමරූප මව්කුසෙහි පහළ නොවේ. ප්‍රතිසන්ධි වශයෙන් විඤ්ඤාණය මව්කුසට බැස ගත්ත ද එය පහ (නිරුද්ධ) වන්නේ නම් නාමරූප පරිපූර්ණත්වයට පත් නොවේ. තව ද විඤ්ඤාණය කලලයකට බැස ගෙන එය කලක් වර්ධනය වී කුමරකු හෝ කුමරියක හෝ බවට පත් ව සිටිය ද විඤ්ඤාණය සිඳෙන්නේ (නිරුද්ධ වන්නේ) නම් එහි දී ද නාමරූප වැඩීමට නොයයි. මෙලෙස බැසගත් විඤ්ඤාණයේ උපකාරයෙන් රූපය (නැතහොත් නාමරූප විඤ්ඤාණ) වර්ධනය වන විට එම නාමරූපයන්ගේ බලපෑම මත චක්ඛුවිඤ්ඤාණ ආදි විඤ්ඤාණ නිර්මාණය වේ. ජරාමරණාදී දුක් හටගන්නේ විඤ්ඤාණය නාමරූපයට බැස ගැනීම් වශයෙනි. මෙයින් පැහැදිලි කෙරෙන්නේ නාමරූපයෙහි වර්ධනයට (නැතහොත් රූපයක් වර්ධනය වීමේ දී) විඤ්ඤාණය කෙතෙක් දුරට වැදගත් ද යන කරුණයි. සත්ත්ව සන්තානගත අවිද්‍යාවේ පමණට විඤ්ඤාණ හා නාමරූපයේ අන්‍යොන්‍ය සම්බන්ධය හා ක්‍රියාකාරීත්වය මත ඉපදීම, දිරීම, මියයාම, ච්‍යුතවීම, නැවත ඉපදීම සිදුවේ (... *නාමරූපං සහ විඤ්ඤාණෙන අඤ්ඤමඤ්ඤපච්චයතාය පවත්තති*).

සූත්‍රයෙහි තවදුරටත් විස්තර කරන පරිදි භාවනා වඩා සිත තැන්පත් කර ගත් ධ්‍යානලාභීන්ට ඇති විය හැකි දෘෂ්ටි පිළිබඳව ද සූත්‍රයෙහි විස්තර වේ. ඒ අනුව

1. *රූපී පරිත්තත්තානු දිට්ඨි* - තමා වැඩූ **(නොමහත්) කසිණාලෝකය නමැති** රූපය ආත්ම වශයෙන් ගනියි.
2. *රූපී අනන්තත්තානු දිට්ඨි* - ඇතැමෙක් **මහත් වූ කසිණාලෝකය නමැති** රූපය **ආත්ම** වශයෙන් සිතති.
3. *අරූපී පරිත්තත්තානු දිට්ඨි* - තවෙකෙක් **ආත්මය රූපී ය කුඩා ය** වශයෙන් සිතයි.
4. *අරූපී අනන්තත්තානු දිට්ඨි* - ඇතැම් අය **ආත්මය රූපී ය අනන්ත ය** වශයෙන් සිතති.

ඇතැමෙක් මෙලෙස රූපය පිළිබඳව දෘෂ්ටි උපදවා ගන්නා අතර තවත් අය සැප, දුක්, උපේක්ෂා ආදි වේදනා ආත්ම වශයෙන් ගෙන දෘෂ්ටීන්හි බැස ගනිති. සංඥා, සංස්කාර, විඤ්ඤාණ පිළිබඳව ද තත්ත්වය මෙබඳු ය. මේ සියලු දෘෂ්ටිවලට පදනම් ලෝකය ඇත යන ශාශ්වත දෘෂ්ටිය හෝ ලෝකය නැත යන උච්ඡේද දෘෂ්ටියයි.

මෙකී දෘෂ්ටීන්වලින් නිදහස් විය හැක්කේ පටිච්චසමුප්පාදය පිළිබඳ නිරවුල් අවබෝධයෙන් යුතු ප්‍රතිපදවකින් පමණි.

විඤ්ඤාණය බැස ගන්නා,, ස්ථාන හත

1. *නානත්තකායා නානත්තසඤ්ඤිනො*
   කායික වශයෙනුත් සංඥා වශයෙනුත් එකිනෙකට වෙනස් සත්ත්ව පැවැත්ම. සතර අපා, මිනිස් ලොව, සදෙව් ලොව මීට නිදසුන් වශයෙන් ගත හැකි ය.

2. *නානත්තකායා එකත්තසඤ්ඤිනො*
   කායික වශයෙන් වෙනස් සංඥා වශයෙන් සමාන සත්ත්ව පැවැත්ම. ප්‍රථම ධ්‍යානලාභී බ්‍රහ්මයන්ගේ පැවැත්ම මෙමඟින් විස්තර වේ.

3. *එකත්තකායා නානත්තසඤ්ඤිනො*
   කායික වශයෙන් සමාන, සංඥා වශයෙන් වෙනස් සත්ත්ව පැවැත්ම. ආභස්සර බ්‍රහ්මයන් බඳු භවයන් මීට අයත් ය.

4. *එකත්තකායා එකත්තසඤ්ඤිනො*
   කායික වශයෙනුත් සංඥා වශයෙන් සමාන සත්ත්ව පැවැත්ම. සුභකිණ්හ බ්‍රහ්මයන් බඳු භවයන් මීට අයත් ය.

5. *අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනූපගා*
   සියලු රූපසංඥා ඉක්මවා පටිඝසංඥා (පංචායතනයට ලක්වන අරමුණු) දුරුකොට නානත්තසඤ්ඤා මෙනෙහි නොකරන අනන්ත වූ ආකාසය අරමුණු කරන සත්ත්ව පැවැත්ම

6. *අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගා*
   සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තය යන්න මෙනෙහි කිරීමෙන් ලබන විඤ්ඤාණඤ්චායතන (භූමිය) මානසිකත්වය.

7. *නත්ථි කිඤ්චි'ති ආකිඤ්චඤ්ඤායතනූපගා*
   සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ද ඉක්මවා කිසිවක් නැත ය යන්න මෙනෙහි කිරීමෙන් ලබන ආකිඤ්චඤ්ඤායතන (භූමිය) මානසිකත්වය.

ඒ ඒ භවයන්හි (අසඤ්ඤසත්ත හා නේවසඤ්ඤානාසඤ්ඤායතනය හැර) සත්ත්වයන්ගේ සිත් බැස ගන්නා (සිත පිහිටා සිටින) ස්ථාන හතක් ගැන මෙමඟින් පැහැදිලි කෙරේ. මීට අමතර ව සත්ත්වයන්ගේ උත්පත්ති සිදු වන එහෙත් සිත ස්ථාවරව බැස නොගන්නා ආයතන දෙකක් පිළිබඳව ද දක්වා තිබේ.

ඒවා නම්

ආයතන දෙක

1. **අසඤ්ඤසත්ත**
   කය (රූපස්කන්ධය) පමණක් පවත්නා අනෙක් ස්කන්ධ නොපවතින අසඤ්ඤසත්ත නම් රූපාවචරය බඹලොව පිළිබඳව මෙමඟින් පැහැදිලි කෙරේ. මෙය සත්ත්වයන් උපදින භවයක් වුව ද විඤ්ඤාණට්ඨිතියක් ලෙස නොසැලකේ. චිත්ත චෛතසික නොපවතින හෙයිනි.

2. **නේවසඤ්ඤානාසඤ්ඤායතන**
   කිසිවක් ඇත්තේ ද නැත නැත්තේ ද නැත යන සංඥාව දියුණු කිරීමෙන් ලබන අරූපාවචර ධ්‍යානයට පත්වීම් වශයෙන් උපදින භූමිය මෙමඟින් දක්වේ. මෙහි රූපස්කන්ධය නොපවතින අතර විඤ්ඤාණය පැවැතීම හෝ නොපැවතීම පිළිබඳ ස්ථාවරත්වයක් නොමැත. මෙය ද සත්ත්වයන් උපදින

භවයක් වුව ද විඤ්ඤාණට්ඨියක් ලෙස නොසැලකේ. මෙහි පිහිටා අවබෝධය පිණිස වෙනත් ධර්මතාවක් සිහි නොකළ හැකි බැවිනි.

අෂ්ට විමෝක්ෂායතන

ක්‍රමයෙන් සිත දියුණු කිරීමෙන් කාම, රූප, අරූප මට්ටම්වලින් සිත නිදහස් වන (මිදෙන) ස්ථාන අටක් මෙහි දැක්වේ.

1. *රූපී රූපානි පස්සති* - කසිණ අරමුණට පාදක වූ රූප රූපී වශයෙන් දකියි.
   කාමාවචර භූමිය ඉක්මවීම් වශයෙන් කසිණ නිමිත්තක් අරමුණු කොට සිත දියුණු කිරීමෙන් කාමලෝකයේ රූපය ඉක්මවීම් වශයෙන් ලබන රූපාවචර ධ්‍යාන මෙමඟින් දැක්වේ. කාමලෝකයෙන් නිදහස්වීම් වශයෙන් මෙහි දී මිදීමට පත් වේ.

2. *අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති* - අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇත්තේ බාහිර රූප සංඥා දකියි.
   තමාගේ කේසාදී මෙනෙහි කිරීම් වශයෙන් ලබන ලද අභ්‍යන්තර රූප සංඥා නැත්තේ බාහිර අරමුණෙහි ඉපිදවූ රූප ධ්‍යාන ඇති මානසිකත්වය මෙයින් දැක්වේ. මෙමඟින් අභ්‍යන්තර වූ රූප සංඥාවෙන් මිදීමට පත් වේ.

3. *සුභන්තේව අධිමුත්තෝ හොති* - බාහිර අරමුණ සුභ වශයෙන් එම අරමුණෙහි බැස ගනියි.
   නීල, පීතාදි වශයෙන් ගත් අරමුණු සුභ වශයෙන් ගෙන එහි දැඩිව බැස ගැනීම මෙහි ස්වභාවයයි.

4. *අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං* - ආකාසය අනන්ත යැයි සිහි කිරීම.
   සියලු ආකාරයෙන් රූපසඤ්ඤා ඉක්මවා පටිඝසඤ්ඤාවන් ද ඉක්මවා ලබන අරූපාවචර ප්‍රථම ධ්‍යාන මෙමඟින් දැක්වේ. රූපාවචර ලෝකයෙන් මිදීම මෙහි දී සිදු වේ.

5. *අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනයං* - අනන්ත වූ විඤ්ඤාණය සිහිකිරීම.
   ආකාසානඤ්චායතනය ද ඉක්මවා විඤ්ඤාණයේ අනන්ත බව සිහිකිරීම් වශයෙන් ලබන මානසික ස්වභාවයයි. මෙහිදී ආකාසානඤ්චායතනයෙන් ද මිදීමට පත් වේ.

6. *නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං* - කිසිවක් නැත යනුවෙන් සිහිකිරීම
   විඤ්ඤාණඤ්චායතනය ද සියලු ආකාරයෙන් ඉක්මවා කිසිවක් නැත යන්න සිහිකිරීම් වශයෙන් ලබන මානසික තත්ත්වයයි. මෙහි දී විඤ්ඤාණඤ්චායතනයෙන් ද මිදීම සිදු වේ.

7. *නෙවසඤ්ඤානාසඤ්ඤායතනං* - කිසිවක් ඇත්තේ ද නැත නැත්තේ ද නැත වශයෙන් සිහිකිරීම
   සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ද ඉක්මවා කිසිවක් ඇත්තේ ද නැත නැත්තේ ද නැත යනුවෙන් සිහිකිරීමෙන් ලබන නේවසඤ්ඤානාසඤ්ඤායතන අරූප ධ්‍යානය මෙයින් විස්තර වේ. නැත යන සංඥාවෙන් ද මිදීම මෙහි දී සිදු වේ.

8. *සඤ්ඤාවේදයිතනිරෝධං* - සඤ්ඤා - වේදනා දුරු කිරීම.
   ආකිඤ්චඤ්ඤායතනය ද සම්පූර්ණයෙන් ඉක්මවීම් වශයෙන් සඤ්ඤා - වේදනා නිරුද්ධ කිරීමෙන් ලබන මානසිකත්වයයි. කාමරාග - පටිඝ සපුරා දුරු කළ නැතහොත් සියලු සංයෝජන ප්‍රහීණ කළ රූපාවචර හා අරූපාවචර ධ්‍යාන ලබා සිටින උතුමකු ලබන විමුක්තිය මෙමඟින් විස්තර වේ.

මහානිදන සූත්‍රයට අනුව පටිච්චසමුප්පාදය පිළිබඳවත් අෂ්ට විමෝක්ෂායතන පිළිබඳවත් අවබෝධය ලැබූ තැනැත්තා අනුලෝම ප්‍රතිලෝම වශයෙන් එම විමෝක්ෂායතනයන්ට පත් ව එයින් නැඟී සිටිමින් ආස්‍රව ක්ෂය කරන අයුරු විස්තර කර තිබේ. එහි ප්‍රතිඵල වශයෙන් චේතෝවිමුත්ති පඤ්ඤාවිමුත්තීන්ට පත් ව සාංදෘෂ්ටික වශයෙන් අවබෝධය ලබන අයුරු දැක්වේ. මෙයට වඩා උත්තරීතර හෝ ප්‍රණීතතර වූ විමුක්තියක් නොමැති බව ද බුදුරජාණන් වහන්සේ අවධාරණය කරති. ආධ්‍යාත්මික වශයෙන් ලද හැකි උපරිම විමුක්තිය මෙයයි.

මහානිදන සූත්‍රයේ පටිච්චසමුප්පාද විග්‍රහයේ දී ජරාමරණ සිට විඤ්ඤාණ දක්වා පටිලෝම ක්‍රමයට හේතුඵල සම්බන්ධතාව විස්තර කර තිබේ. එහෙත් විඤ්ඤාණයට හේතුවන සංඛාර හා අවිජ්ජා යන අංග දෙක විස්තර කර නොමැත. මෙම සූත්‍රය දේශනා කර ඇති පර්යාය අනුව වුව ද විඤ්ඤාණය යනුවෙන් දැක්වීමේ දී එහි අවිද්‍යා හා සංස්කාර ඇති බව අප හඳුනාගත යුතු වේ.

සංඛාර - විතර්කනය කිරීම හෙවත් සිතිවිලි 'සංඛාර' = සංස්කාර නමින් ව්‍යවහාර කෙරේ. අවිද්‍යාව නිසා හටගන්නා මෙම සංඛාර 'කායසංඛාර (කායසංචේතනා), වචීසංඛාර (වචීසංචේතනා), චිත්තසංඛාර (මනෝසංචේතනා)' වශයෙන් තුන් ආකාර වේ. තවත් න්‍යායකට අනුව මෙය පුඤ්ඤාභිසංඛාර (කාමාවචර, රූපාවචර කුසලචේතනා), අපුඤ්ඤාභිසංඛාර (කාමාවචර අකුසල චේතනා), ආනෙඤ්ජාභිසංඛාර (අරූපාවචර කුසලචේතනා) වශයෙන් ද දක්වා තිබේ (විභ.ප.1, 244 පිට). සංඛාරයට හේතුව, ආහාරය හෙවත් නිදනය වශයෙන් දක්වා ඇත්තේ අවිද්‍යාවයි. අවිද්‍යාව ඇති කල්හි සංඛාර හටගන්නා අතර අවිද්‍යා නිරෝධයෙන් සංඛාර නිරුද්ධ වේ (විභ.ප.1, 244 පිට).

අවිජ්ජා - ලෝකය හෙවත් දුකෙහි හටගැනීම හා නිරෝධය නොදන්නා ස්වභාවය 'අවිජ්ජා' = අවිද්‍යා නම් වේ. එනම් දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍යය (විභ.ප.1, 244 පිට). නැතහොත් පටිච්චසමුප්පාදය නොදන්නා බවයි, සම්මාදිට්ඨිය නොමැති බවයි. අවිද්‍යාවට හේතුව වශයෙන් දක්වා ඇත්තේ ආස්‍රවයි. ආස්‍රවයට හේතුව අවිද්‍යාවයි. මෙම දෙක අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාත්මක වේ.

මේ අනුව අවිද්‍යාව ඇති කල්හි සංඛාර (චේතනා) හටගනි. සංඛාර ඇති කල්හි විඤ්ඤාණ හටගනී. විඤ්ඤාණ ඇති කල්හි නාමරූප හටගනී. නාමරූප ඇති කල්හි සළායතන හටගනී. සළායතන ඇති කල්හි ඵස්ස හටගනී. ඵස්ස ඇති කල්හි වේදනා හටගනී. වේදනා ඇති කල්හි තණ්හා හටගනී. තණ්හා ඇති කල්හි උපාදාන හටගනී. උපාදාන ඇති කල්හි භව හටගනී. භව ඇති කල්හි ජාති හටගනී. ජාති ඇති කල්හි ජරාමරණාදි දුක් සමුදය හටගනී. අවිජ්ජා, සංඛාර ආදි කරුණු මෙහිලා විශේෂ කොට දැක්වුව ද මේ හැම අංගයක් තුළ ම රූපාදී ස්කන්ධ පංචකය ම පවතී. එනම් අවිද්‍යා පාදකව හටගත් අඤ්ඤාණ චර්යාව ක්‍රියාත්මක වේ. මධුපිණ්ඩික සූත්‍රයට අනුව අවිද්‍යා සහගත ඇස ඇති කල්හි රූප, චක්ඛු විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්ස ආදි අංග ඇති කල්හි අතීත, අනාගත, වර්තමාන රූපාදිය පිළිබඳ ප්‍රපංච ගොඩනැඟී ජරාමරණාදි දුක් හටගන්නා ආකාරය විස්තර කර ඇත්තේ ද මේ න්‍යායට අනුගතවයි.

භාග්‍යවතුන් වහන්සේ පටිච්ච සමුප්පාදය විවිධාකාරයෙන් දේශනා කර ඇති ආකාරය ත්‍රිපිටකය විමසා බැලීමෙන් පැහැදිලි වේ. කුමන ආකාරයෙන් එය විස්තර කළ ද එහි ඇති සාරය නොහොත් සැකැස්ම සමාන වූවකි. සංයුත්ත නිකායේ සෝතාපත්ති සංයුත්තයේ සඳහන් තතිය අනාථපිණ්ඩික සූත්‍රයෙහි පටිච්චසමුප්පාදයේ මෙම මූලධර්මය විස්තර කර තිබේ.

*'කතමො චස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො? ඉධ ගහපති, අරියසාවකො පටිච්චසමුප්පාදං යෙව සාධුකං යොනිසො මනසිකරොති, 'ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉති ඉමස්මිං අසති ඉදං න හොති ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති.'*

කවර නම් ආර්ය න්‍යායක් ශ්‍රාවකයකු විසින් ප්‍රඥාවෙන් මැනැවින් දැක්ක යුතු ද යන්න මෙහි දැක්වේ. ඒ අනුව පටිච්චසමුප්පාදය මනා කොට නුවණින් මෙනෙහි කළ යුතු බව අවධාරණය කර තිබේ. එනම් මෙලෙස හේතු ඇති කල්හි මෙම ප්‍රතිඵලය වේ. මෙය හටගැනීමෙන් මෙය උපදී. මෙය නැති කල්හි මෙය නොවේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ. පටිච්ච සමුප්පාදය න්‍යාය විස්තර කෙරෙන සංක්ෂිප්ත පැහැදිලි කිරීම මෙයයි. එය ම *'අවිජ්ජා පච්චයා සංඛාරා ...'*. ආදි වශයෙන් අංග දොළහකින් යුතුව මධ්‍යම වශයෙන් ද 'හේතු, ආරම්මණ අධිපති....' ආදි වශයෙන් සූවිසිප්‍රත්‍ය ක්‍රමයට විස්ථාරිත වශයෙන් ද මෙය දේශනා කොට තිබේ. ශ්‍රාවකයන්ගේ බුද්ධියේ පමණට භාග්‍යවතුන් වහන්සේ මෙලෙස විවිධාකාරයෙන් පැහැදිලි කොට තිබේ. පටිච්චසමුප්පාදය තේරුම් ගත් පමණට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ අවබෝධ වනු ඇත.

බුද්ධශාසනයට යමකු සැබෑ ලෙස ස්ථාවරව බැස ගන්නේ බුදුසසුනට ම ආවේණික වූ ලෝක යථාර්ථය නිවැරදි ලෙස ශ්‍රවණය කිරීම් වශයෙනි. එනම් **හේතු ඇති කල්හි පෙර නොතිබී හටගන්නා ලෝකය හේතු නිරුද්ධ වීමෙන් ඉතිරි නැතිව නිරුද්ධ වන බව පිළිබඳ යථාර්ථයයි** (*අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති*). අවිද්‍යාව ඇති කල්හි ලෝකයක් ඇතැයි නිර්මාණය කර ගන්නා අතර අවිද්‍යාව නැති කල්හි අවිද්‍යාවෙන් හටගත් ලෝකය ද නිරුද්ධ වේ. අතීත කර්මවිපාක වශයෙන් වර්තමානයෙහි නිර්මාණය වන පංචස්කන්ධ ලෝකය නුවණින් නොදකීම නිසා ඒ අරහයා චේතනා (පුඤ්ඤ, අපුඤ්ඤ, ආනෙඤ්ජ වශයෙන් සංස්කාර) නිර්මාණය වුවහොත් පංචුපාදානස්කන්ධ ගොඩනැඟේ. ඉන්පසු ඊට අනුගතව විඤ්ඤාණ, නාමරූප ආදි සෙසු අංග නිර්මාණය වී දුක හටගන්නා ආකාරය අනුපිළිවෙළින් මෙලෙස විස්තර කර ඇත. ඒ අනුව

*'අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණසෝකපරිදේව දුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදෙ.'* (පටිච්චසමුප්පාද සූත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 02 පිට)

මෙලෙස අවිද්‍යා සහගතව හටගන්නා ලෝකය නිසා අඥ්ඥාණ චර්යාවෙහි ප්‍රතිඵල වශයෙන් ජරාමරණාදි දුක් සමුදය නිර්මාණය වේ. අවිද්‍යාව පාදකව ලෝකය හා දුක නිර්මාණය වීම තේරුම් ගැනීම බුදුරදුන් පිළිබඳ ශ්‍රද්ධාව ඇති වීමටත් එමඟින් ප්‍රමුදිතබව, ප්‍රීතිය, පස්සද්ධිය, සුඛය, සමාධිය, යථාභූතඥාණදස්සනය, නිබ්බිදව, විරාගය, විමුත්තිය ආදි සියලු ආධ්‍යාත්මික ස්තරයන්හි පදනම පටිච්චසමුප්පාදය තේරුම් ගැනීමයි (උපනිස සූත්ත, සංනි.2, 50 පිට).

මෙලෙස යමෙකු පටිච්චසමුප්පාදයෙහි යථා ස්වභාවය දැන අවිද්‍යාව ඉතිරි නැතිව හට නොනැගෙන අයුරින් සිහිනුවණින් (සතිසම්පජඤ්ඤයෙන්) යුතුව වාසය කළහොත් ජරාමරණ සංඛ්‍යාත ලෝකයක් ද නිර්මාණය නොවනු ඇත. එමඟින් ජරාමරණාදි දුක් සමුදයයෙන් සපුරා නිදහස්වීමට ද අවස්ථාව උදා වේ. එය මෙලෙස විස්තර වේ.

*'අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරෝධා සංඛාර නිරෝධෝ සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධෝ නාමරූප නිරෝධා සළායතන නිරෝධෝ සළායතන නිරෝධා ඵස්ස නිරෝධෝ ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ උපාදාන නිරෝධා භව නිරෝධෝ භව නිරෝධා ජාති නිරෝධෝ ජාති නිරෝධා ජරාමරණසෝකපරිදේව දුක්ඛ දෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමේතස්ස කේවලස්ස දුක්ඛන්ධස්ස නිරෝධෝ හොති' අයමස්ස අරියෝ ඤායෝ පඤ්ඤය සුදිට්ඨෝ හෝති සුප්පවිද්ධෝ'.*

අවිද්‍යාව ඉතිරි නැතිව නිරෝධ කිරීම ජරාමරණාදි සියලු දුක්වල නිරෝධය වේ. මෙලෙස දුකෙහි හටගැනීම හා නිරෝධය පිළිබඳ ආර්ය න්‍යාය වූ පටිච්චසමුප්පාදය මැනැවින් අවබෝධ කර ගැනීම සෝතාපන්න වීමේ මාවතයි. යමෙක් බිය හා වෛරය ගෙනදෙන පංච දුශ්චරිතයන් දුරු කළේ වේද සතර සෝතාපත්ති අංගයන්ගෙන් යුක්ත වූයේ ද ඉහත දැක්වූ ආර්ය න්‍යාය දක්නේ වේ ද ඔහු ක්ෂය කළ නිරය ඇත්තේ (*ඛීණනිරයයොම්හි*) වෙමියි ද, ක්ෂය කළ තිරිසන් දුගති විපාක ඇත්තේ වේ ද (*ඛීණතිරච්ඡානයෝනියෝ*), ක්ෂය කළ ප්‍රේත විෂය ඇත්තේ ද (*ඛීණපෙත්තිවිසයො*), ක්ෂය කළ දුගතිවිපාක ඇත්තේ ද (*ඛීණාපායදුග්ගතිවිනිපාතො*), සෝවාන් වූයෙමි (*සෝතාපන්නෝහමස්මි*), පහළට නොවැටෙන ස්වභාවයෙන් යුක්ත වූයේ (*අවිනිපාතධම්මෝ*), නියත වශයෙන් සම්බෝධිපරායණ වූයේ (*නියතෝ සම්බෝධිපරායණො*) වෙමි'යි පවසන්නේ ය. මෙහිලා සිදුවන්නේ අතීත කර්ම වශයෙන් ලද ස්කන්ධ පංචකය පිළිබඳ මනා නුවණින් හා සිහියෙන් ක්‍රියා කරමින් ඤාණ චර්යාවට අනුගතව ක්‍රියා කිරීමයි.

ඉහත පාඨයෙන් ඉතා පැහැදිලි වන යථාර්ථය නම් බිය - වෛරය ගෙන දෙන කරුණුවලින් මිදීමටත් සතර අපායෙන් නිදහස් වීමටත් සෝතාපන්න වීමටත් හේතුවන ප්‍රධාන සාධකය පටිච්ච සමුප්පාදය ඔස්සේ දුක අවබෝධ කර ගැනීම බවයි. මෙම අවබෝධයත් සමග සතර සෝතාපත්ති අංගයන්හි ස්ථාවර ව බැස ගනී. එනම් බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන කෙරෙහි ස්ථාවරව නොසෙල්වෙන ප්‍රසාදය සහ ආර්ය කාන්ත ශීලයෙන් සමන්විත වීමයි. එනම් ආර්ය උතුමන් විසින් අගය කළ පංචසීලය පිහිටා සිටී. බිය හා වෛරය දුරු කොට සතර අපායෙන් නිදහස්වීමේ ඒකායන මාවත මෙයයි. පටිච්ච සමුප්පාදය මැනැවින් අවබෝධ කර ගැනීම ඇත - නැත

යන අන්තයන්ගෙන් දුරුවීමටත් චතුරාර්ය සත්‍යය වටහා ගැනීමටත් ඒ ඔස්සේ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරමින් ස්කන්ධ, ධාතු, ආයතන, නාමරූප ආදි ජීවිත යථාර්ථ පිරිසිඳ දැන ගැනීමටත් අවස්ථාව උදාවේ. **එබැවින් පටිච්ච සමුප්පාදය අවබෝධ කර ගැනීම බුදුදහමට අනුව සුගතිය හා විමුක්තිය සාක්ෂාත් කර ගැනීමේ මූලික පදනම ලෙස සඳහන් කළ හැකි ය.** මෙලෙස පටිච්ච සමුප්පාදය තේරුම් ගැනීමට සසරගත පුණ්‍ය මහිමයක් මෙන් ම නුවණැතිබව, අවංකබව හා සුවචබව යන ගුණාංග තමා තුළ තිබීම අත්‍යවශ්‍ය වේ. මෙහිලා කල්‍යාණ මිත්‍ර ආශ්‍රය සුවිශාල කාර්යභාරයක් ඉටු කරයි.

පටිච්ච සමුප්පාදය වටහා ගැනීම ධර්මය වටහා ගැනීමට අන්‍යෝන්‍ය වශයෙන් උපකාරවත් වේ. ධර්මය තේරුම් ගැනීම බුදුරජාණන් වහන්සේ කවරෙක් ද යන අවබෝධ කර ගැනීමට ද උපකාරවත් වනු ඇත.

*'යො පටිච්චසමුප්පාදං පස්සති සො ධම්මං පස්සති, යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සති.'*
යමෙක් පටිච්චසමුප්පාදය දකියි ද ඔහු ධර්මය දකියි. යමෙක් ධර්මය දකියි ද ඔහු පටිච්චසමුප්පාදය දකියි.
*(මහාහත්ථිපදෙපම සුත්ත, ම.නි.1, 460 පිට)*

*'යො බො වක්කලී ධම්මං පස්සති සො මං පස්සති, යො මං පස්සති සො ධම්මං පස්සති.'* (වක්කලී සුත්ත, සං.නි.3, 208 පිට)

යමෙක් ධර්මය දකියි ද ඔහු මා (බුදුරදුන්) දකියි. යමෙක් බුදුරදුන් දකියි ද ඔහු ධර්මය දකියි.

'ඇත - නැත' යන අන්තයන්ගෙන් දුරුව මධ්‍ය මාර්ගය නිසි ලෙස මුණ ගැසෙන්නේ පටිච්චසමුප්පාද න්‍යාය මැනැවින් ශ්‍රවණය කිරීමෙනි. හේතු එක්වීම් වශයෙන් ස්කන්ධ පංචකයේ හටගැනීම (සමුදය) දකින්නා 'නැත' යන උච්ඡේද අන්තයෙන් (දෘෂ්ටියෙන්) මිදේ. හේතු නිරුද්ධවීමෙන් ස්කන්ධ පංචකයේ වැයවීම (වය=නිරෝධය) දකින්නා 'ඇත' යන ශාශ්වත අන්තයෙන් ද මිදේ. මෙලෙස සම්මාදිට්ඨිය උපදවා ගෙන 'ඇත සහ නැත' යන අන්ත දෙකින් ම එකවර නිදහස්වීමට අවස්ථාව ලැබෙන්නේ පටිච්ච සමුප්පාදය නම් වූ ආර්ය න්‍යාය නිවැරදි ලෙස අසා දැන ගැනීමෙනි (කච්චානගොත්ත සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 28 පිට). තව ද සැබෑ ලෙස ධර්මකථිකයකු බවට පත් විය හැක්කේ ද මෙම ආර්ය න්‍යාය මැනැවින් දේශනා කිරීම් වශයෙනි (ධම්මකථික සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 28 පිට). *'දිට්ඨිං ච අනුපගම්ම සීලවා...'* යනුවෙන් දැක්වෙන පරිදි දෘෂ්ටීන්ට නොපැමිණ (මෙත්ත සුත්ත) සීලයට පැමිණිය හැක්කේ පටිච්චසමුප්පාදය න්‍යාය තේරුම් ගැනීමේ ප්‍රතිඵල වශයෙනි.

පළමුව පටිච්චසමුප්පාදය පිළිබඳ කල්‍යාණ මිත්‍ර ඇසුරින් සුතමය ඤාණය ලබා ඉන්පසු එය හැකිතාක් දුරට නුවණින් මෙනෙහි කිරීම් වශයෙන් චින්තාමය ඤාණය දියුණු කර ගනිමින් සතර සතිපට්ඨානය තුළ පිහිටා සීල සමාධි පඤ්ඤා වර්ධනය කර ගැනීම් වශයෙන් භාවනාමය ඤාණය ඇති කර ගැනීම අවශ්‍ය වේ.

*'අවිජ්ජා පච්චයා සංඛාරා...'* ආදි වශයෙන් විස්තර කෙරෙන පටිච්චසමුප්පාදයේ අංග දෙළොස ආරෝහණ ක්‍රමයට ද අවරෝහණ ක්‍රමයට ද හටගන්නා ක්‍රමයට ද නිරුද්ධ කරන ක්‍රමයට ද විස්තර කර තිබෙනු දක්නට ලැබේ. භාග්‍යවතුන් වහන්සේ චතුරාර්ය සත්‍යාවබෝධයේ දී (උදානපාලියෙහි සඳහන් පරිදි) අවිද්‍යාවේ පටන් ක්‍රමයෙන් දුක හටගන්නා ආකාරය දක්වා තිබෙන අතර ශ්‍රාවකයන්ට එය සත්‍ය ගවේෂණයක් ලෙස පැහැදිලි කිරීමේ දී (විභංග-සං.නි.අභිසමය සංයුත්ත, 2, 4 පිට ආදි සූත්‍රයන්ට අනුව) ජරාමරණාදි වශයෙන් දැනට පෙනෙන දුකෙහි පටන් නොපෙනනෙ අවිද්‍යාව දක්වා විස්තර කර තිබෙනු දක්නට ලැබේ.

මෙලෙස දුක හටගන්නා වූ අවිද්‍යාව නැති කල්හි (අවිද්‍යාපාදක) සංඛාර, විඤ්ඤාණ, නාමරූපාදි අංග හටනොගන දුකින් නිදහස් වේ (විභංග සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 4-6 පිටු). එනම් ඤාණ චර්යාවෙන් යුතුව ක්‍රියා කිරීමයි. මේ සඳහා ඇති මාවත වශයෙන් දක්වා ඇත්තේ සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මසති, සම්මාසමාධි වශයෙන් දැක්වෙන ආර්ය අෂ්ටාංගික මාර්ගයයි (ඤාණවත්ථු සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 88-90 පිට). සංක්ෂිප්තව කිවහොත් සතිය හා සම්පජඤ්ඤය තුළ වාසය කිරීමයි. එනම් සමථ විදර්ශනා මාවතෙහි අඛණ්ඩව වාසය කිරීමයි. මධුපිණ්ඩික සූත්‍රයට අනුව අවිද්‍යා සහගත ඇස නැති කල්හි රූප, චක්ඛු විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්ස ආදි අංග නැති කල්හි අතීත, අනාගත, වර්තමාන රූපාදිය පිළිබඳ ප්‍රපංච ගොඩනොනැගී ජරාමරණාදි දුක් සමුදයෙන් නිදහස්විය හැකි ආකාරය විස්තර කර ඇත්තේ ද මේ න්‍යායට අනුගතවයි.

තව ද *'අවිජ්ජා පච්චයා සංඛාරා ...'* ආදි වශයෙන් දැක්වෙන දුකෙහි හටගන්නා ප්‍රතිපදාව මිථ්‍යා ප්‍රතිපදාව ලෙසත් *'අවිජ්ජායත්වේව අසේසවිරාගා නිරෝධා සංඛාර නිරෝධෝ ....'* ආදි වශයෙන් දැක්වෙන දුක නිරුද්ධ කරන ප්‍රතිපදාව සම්‍යග් ප්‍රතිපදාව වශයෙන් ද දක්වා තිබේ (පටිපද සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 8 පිට). අවිද්‍යාදි හේතු ඇති කල්හි දුකෙහි හටගැනීමත් අවිද්‍යාවේ නිරෝධයෙන් දුකෙහි නිරෝධයත් තේරුම් ගැනීමේ ප්‍රතිඵල වශයෙන් සත්ත්ව පුද්ගල දෘෂ්ටියට නොවැටී හේතුඵල සිද්ධාන්තය මැනැවින් තේරුම් ගැනීමට හැකියාව ලැබේ. එවිට මේ දුක තමා විසින් නිර්මාණය කරන ලද්දක් හෝ අනෙකකු විසින් නිර්මාණය කරන ලද්දක් හෝ වශයෙන් දෘෂ්ටියකට නොපැමිණේ. හේතු ඇති කල්හි දුක හටගෙන හේතු නිරුද්ධ වීමෙන් දුක නිරුද්ධ වන බව ප්‍රත්‍යක්ෂ වේ (අචේලකස්සප සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 30 පිට). මේ අවබෝධයත් සමඟ තමා අතීතයේ සිටියා ද නැද්ද අනාගතයෙහි සිටින්නේ ද නැද්ද ආදි සියලු මතවාද සමනය වේ (පච්ච සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 42 පිට). තව ද තමාගේ සිත - කය තමා විසින් කරන ලද්දක් හෝ අනෙකකු විසින් කරන ලද්දක් හෝ නොව හේතුඵල සිද්ධාන්තය මත නිර්මාණය වූවක් ය යන අවබෝධය ද මෙමගින් පසක් වේ (නතුම්හ සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 100 පිට).

දුකෙහි හටගැනීම හා නිරෝධය පිළිබඳ මෙම සුවිශේෂී අවබෝධය අප ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේට මෙන් ම විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝනාගමන, කස්සප යන පෙර වැඩ සිටි බුදුරජාණන් වහන්සේලාට ද ඒ අයුරින් අවබෝධ වූ ආකාරය විස්තර වේ. එපමණක් නොව ලොව පහළ වන සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලා අවබෝධ කර ගන්නා ප්‍රධාන කරුණ ද මෙයයි. එබැවින් පෙර බුදුවරුන් ද ප්‍රත්‍යක්ෂ කළ පටිච්චසමුප්පාද සංඛ්‍යාත මෙම මාවත පුරාණ මාවතක් වශයෙන් විස්තර කර තිබේ (නගර සුත්ත, සං.නි. 2, අභිසමය සංයුත්ත, 162 පිට).

පටිච්චසමුප්පාදයේ දැක්වෙන අවිජ්ජාදි අංග එක් චිත්තක්ෂණයක් තුළට මෙන් ම අතීත - වර්තමාන - අනාගත යන කාලයත්‍රයට ද ගොනු කළ හැකිය. කාලත්‍රයට අනුව පටිච්චසමුප්පාදය විස්තර කිරීමේ දී අතීත හේතු, වර්තමාන ඵල, වර්තමාන හේතු, අනාගත ඵල වශයෙන් සතරාකාරයකට විස්තර කර තිබේ.

| | |
|---|---|
| **අතීත හේතු** | අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව |
| **වර්තමාන ඵල** | විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා |
| **වර්තමාන හේතු** | අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව |
| **අනාගත ඵල** | විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා |

අතීතයේ පැවැති අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව යන හේතුවලට අනුරූපව වර්තමාන ජීවිතය හෙවත් විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන ස්කන්ධ පංචකයක් නිර්මාණය වේ. අප ඇස, කණ ආදි ඉන්ද්‍රිය ඔස්සේ රූප, ශබ්දාදි අරමුණු මුලින් ස්පර්ශ කිරීමේ දී හටගන්නේ මෙයයි. මෙය ලෝභ, දෝස, මෝහ යන හේතුන්ගෙන් තොර වූවකි. එය ඇතැම් තැනෙක දුක්ඛ සත්‍යය වශයෙන් ද දක්වා තිබේ. මෙම ස්කන්ධ පංචකය අවිද්‍යාදි අනුසය ඇතිව ස්පර්ශ කළ විට වර්තමාන හේතු නිර්මාණය වේ. එනම් ස්කන්ධ පංචකය ම පංචුපාදානස්කන්ධයක් බවට පරිවර්තනය කර ගනී. මෙලෙස අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව යන හේතු පහළ කළ හොත් අනාගතය නිර්මාණය වේ. එවිට විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන ඵලයන් භුක්ති විඳීමටත් දුක ස්පර්ශ කිරීමටත් සිදු වේ. එක චිත්තක්ෂණයක් තුළ වුව ද මෙම අංග සියල්ලෙහි සම්බන්ධය විස්තර කළ හැකි ය. එනම් මධුපිණ්ඩික සූත්‍රයෙහි දැක්වෙන පරිදි අවිද්‍යා සහගතව ඇස උපන් කල්හි රූපය, චක්ඛු විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්සය ආදි අංග ගොඩනැඟී ප්‍රපංච නිර්මාණය වේ. ලෝකයා දුක තුළ වාසය කරයි *'දුක්ඛෙ ලෝකො පතිට්ඨිතො...'* යනුවෙන් දැක්වෙන්නේ අවිද්‍යා සහිත ලෝකයා දුක තුළ වාසය කරන ආකාරයයි. සංසාරය නිර්මාණය වන්නේ මේ අයුරිනි. එමෙන් ම අවිද්‍යාවෙන් තොරව ඇස, රූපාදි කරුණු ස්පර්ශ නොකළ හොත් ප්‍රපංච ගොඩනොනැඟී දුකින් නිදහස්වීමට ද අවස්ථාව උදාවේ.

| | | |
|---|---|---|
| **අතීත** | 1. අවිජ්ජා<br>2. සංඛාර | **කර්ම භව** |
| **වර්තමාන** | 3. විඤ්ඤාණ<br>4. නාමරූප<br>5. සළායතන<br>6. ඵස්ස<br>7. වේදනා | **උත්පත්ති භව** |
| | 8. තණ්හා<br>9. උපාදාන<br>10. භව | **කර්ම භව** |
| **අනාගත** | 11. ජාති<br>12. ජරාමරණ | **උත්පත්ති භව** |

පටිච්චසමුප්පාදයේ අංග එකිනෙකට දම්වැලක් සේ සම්බන්ධව පවතී. අවිද්‍යාව සංස්කාරයටත් සංස්කාරය අවිද්‍යාවටත් .... ආදි වශයෙනි. මෙහිලා අවිද්‍යාවේ පටන් උපාදාන දක්වා අංග නවය එකිනෙකට අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වේ. උපාදාන සිට සෙසු අංග උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජති පච්චයා ජරාමරණං වශයෙන් එක් දිශාවකට පමණක් සම්බන්ධ වේ. ඒ අතර විඤ්ඤාණ - නාමරූප දෙකෙහි සම්බන්ධය සූත්‍ර කිහිපයක ම විශේෂයෙන් අවධාරණය කර තිබෙනු දක්නට ලැබේ (...*යදිදං නාමරූපං සහ විඤ්ඤාණේන අඤ්ඤමඤ්ඤපච්චයතාය පවත්තති'* මහානිදාන සූත්‍රය, දී.නි.2, 94 පිට). නලකලාප සූත්‍රයෙහි දැක්වෙන පරිදි එකිනෙකට හේත්තු කොට සිටුවා ඇති බට මිටි දෙකක් එකිනෙක ආධාරයෙන් පවතින්නාක් මෙන් නාමරූප - විඤ්ඤාණ දෙක එකිනෙකට උපකාරවත් ව පවතී. මෙලෙස නාමරූප හා විඤ්ඤාණ යන අංග දෙක විශේෂයෙන් අවධාරණය කිරීමට ප්‍රධාන හේතුව වන්නේ එක් භවයකින් තවත් භවයකට ප්‍රතිසන්ධි ගැනීමේ දී මේ අංග දෙක පැහැදිලි කාර්යභාරයක් සිදු කරන හෙයිනි.

අවිද්‍යාව නිසා හටගන්නා මෙම සංසාර චක්‍රයෙන් මිදිය හැක්කේ ඉහත සිද්ධාන්තය මැනැවින් තේරුම් ගෙන සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවෙහි පිහිටා ස්කන්ධ, ධාතු, ආයතන, නාමරූප ආදි ධර්මතා අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කිරීමෙහි අඛණ්ඩව නියැළීමෙහි ප්‍රතිඵල වශයෙනි. එහි ප්‍රතිඵල වශයෙන් සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්ම, සති සම්බොජ්ඣංග ආදි බොජ්ඣංග පරිපූර්ණත්වයට පත් ව විද්‍යා - විමුක්ති සාක්ෂාත් කිරීමෙනි. ඒ සඳහා අප්‍රමාදී ව ධර්මයෙහි හැසිරීමට අදිටන් කර ගනිමු.

ඔබ සැමට තෙරුවන් සරණයි !

එක්සත් ජනපදයේ කොවිනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයේ

**දසදින සූත්‍රධර්ම විවරණ වැඩසටහන 10 වන දේශනය**

(2020 දෙසැම්බර මස 28 වන සඳුද) (UD)